**නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය - 2014**

---

නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 109 දරන ණය ගිවිසුමේ ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුමට අනුව වර්තමානයේ මහ මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය එවකට වරාය මහ මාර්ග සහ නාවික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, ඌව, සබරගමුව පළාත් වල උස් භූමි ප්‍රදේශ වල යෝග්‍ය ප්‍රතික්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මගින් මූලික යටිතල පහසුකම් ලෙස ඒ-ශ්‍රේණියේ ජාතික මාර්ග සඳහා ඉලක්ක වී ඇති නායයෑම් ආපදා අවම කිරීම හා එමගින් ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම හා මාර්ග ජාලයේ ආරක්ෂාව තහවුරු කිරීම මෙන්ම මාර්ග භාවිතාකරන්නන් සහ පදිංචිකරුවන්ගේ ජීවිත සුරක්ෂිතතාව ඇතිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

ව්‍යාපෘතියේ විෂය පථය,

(i) මාර්ග ආපදා කළමනාකරණ ආදර්ශ ප්‍රදේශ සඳහා ප්‍රතික්‍රියාමාර්ග,
(ii) ආපදා කළමනාකරණය හා අනෙකුත් අදාල පහසුකම් සඳහා ජාතික මාර්ග වල ඉහල ප්‍රමුඛතාවයෙන් යුතු ප්‍රදේශ සඳහා ප්‍රතික්‍රියාමාර්ග,
(iii) කලින් අවවාද දීමේ පද්ධති ඇතිකිරීම,
(iv) උපදේශන සේවා සැපයීම ආදියෙන් සමන්විත විය.

ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 14,754 කට සමාන ජපන් යෙන්. මිලියන 9,841 ක් වූ අතර ඉන් රු. මිලියන 11,423 කට සමාන ජපන් යෙන් මිලියන 7,619 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මාර්තු 14 දින ආරම්භ කළ අතර 2019 මාර්තු 31වන විට අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂය තුළදී නාය යාම් අපදා ව්‍යාපෘතිය වෙත මාරු කරන ලද දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් ටෙන්ඩර් මණ්ඩල සාමාජිකයන් වෙත ගෙවන ලද රු. 157,500 ක දීමනා, සාමාජික මුදල් ලෙස මූලා ප්‍රකාශන වල දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජ.අ.ස.නි | 7,619.00 | 11,423.00 | 250.00 | 177.90 | 142.28 | 177.90 |
| ශ්‍රී.ලං.ර | 2,222.00 | 3,331.00 | 50.00 | 19.40 | - | 30.20 |
| එකතුව | 9,841.00 | 14,754.00 | 300.00 | 197.30 | 142.28 | 208.10 |

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වයට අමතරව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වානිජ බැංකුවකින් ලබාගත් රු. මිලියන 09 ක ණය මුදලක් ණය සපයන ඒජන්සියේ අනුදැනුමකින් තොරව ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා උපයෝජනය කර තිබුණි. තවද ණය නැවත ගෙවීම සඳහා ව්‍යාපෘතිය සමග ඇතිකර ගත් වගකීම පිලිබඳව විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) වරාය හා මහමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ 2013 ජූලි 03 දිනැති අංක එම්පීඑච්/එච්ඩබ්ලිව්වයි/ජීසීසී/03/03/01 දරන චක්‍රලේඛය අනුව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව නිවැරදිව පිළියෙල කළ යුතුය. සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ ශ්‍රී ලංකා රජයේ දායකය යටතේ රු. මිලියන 50 ක් වෙන්කර දී තිබුණු අතර රු. මිලියන 19.4 ක් පමණක් උපයෝජනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 30.6 ක අධි ඇස්තමේන්තුවක් දැක්වුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

-----------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ප්‍රධාන වර්ගීකරණ 02 ක් යටතේ, ප්‍රමුකත්වය ඉහළම කොටස් සඳහා නායයෑම් ආරක්ෂණ විමර්ශන අදියරයන් 2014 දෙසැම්බර් 21 දිනට සියයට 95 ක් අවසන් කර තිබුණි. තවද, 2014 දෙසැම්බර් 31 දිනට අනතුරු කලින් දැනුම් දීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 65 මට්ටමක පැවතුණි.

**3.3 මූල්‍ය පාලනයේ අඩුපාඩු**

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද උපදේශක තනතුරක් සඳහා පුද්ගලයෙකු පත්කර තිබුණු අතර වැටුප් හා වාහන දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු. 780,000 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති අරමුණු ළඟාකර ගැනීම වෙනුවෙන් උපදේශකගේ දායකත්වය තහවුරු කර ගැනීම සඳහා පැමිණීම්, වැඩ පැවරුම් හා කළ වැඩ වාර්තා ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 හී ප්‍රතිපාදනයන්ට අනුව ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.